**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඉන්දියාවට සහයෝගය පළ කරමින් ලිපියක්</u>**

ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2021 අප්‍රේල් 28 වන දින අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා හට ලිපියක් යොමු කරමින් ඉන්දියාව මුහුණ දී සිටින කොවිඩ් වසංගත තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සංවේගය පළ කළේය.

2. අතීතයේ සිටම මෙවන් වසංගත තත්ත්වයන් ජය ගැනීමට ගන්නා ලද මනුෂ් යත්වයේ සාමූහික ප්‍රයත්නයන් සාර්ථක වී ඇති බව ශ්‍රී ලංකා ජනාධිපතිතුමා ප්‍රකාශ කළේය. මනා කැපවීමක් සහිත විද්වතුන් සහ වෘත්තීයවේදීන්ගේ සහයෝගයෙන් අග් රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ නායකත්වය යටතේ ඉන්දියාව මෙම අර්බුදයට සාර්ථකව මුහුණ දෙනු ඇතැයි එතුමා විශ්වාසය පළ කළේය.

3. ශ්‍රී ලංකාවේ මහා සංඝරත්නය ඉන්දීය ජනතාව වෙනුවෙන් රතන සූත්‍රය දේශනා කිරීමට සූදානම් වන බව ජනාධිපතිතුමා අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාට දන්වා සිටියේය.

4. අතිගරු ජනාධිපතිතුමාගේ සහ මහා සංඝරත්නයේ කාරුණිකභාවය තුළින් පිළිඹිබු වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සියවස් ගණනාවක් පුරා පවතින සමීප සබඳතාවයේ ගැඹුර සහ ශක්තිමත්භාවයයි. කොවිඩ් 19 වසංගත තත්ත්වය විසින් මතුකර ඇති අභියෝගාත්මක කාලයේදී ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ සිටීම ඉන්දීය නායකත්වය සහ ජනතාව ඉතා අගය කොට සලකයි.

5. මූලික සැලැස්මට පෙර ශ්‍රී ලංකාවේ එන්නත්කරණ වැඩසටහන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජයට අවස්ථාව උදා කරමින් ඉන්දියාව විසින් පරිත්‍යාග කරන ලද ඉන්දියාවේ නිෂ්පාදිත කොවිඩ්-19 එන්නත් මාත්‍රා 500,000 සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් ඉන්දියාවට හෘදයාංගම කෘතවේදීත්වය පළ කළේය.

6. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතය විසින් මතුකර ඇති දැවැන්ත අභියෝගයන්ට මුහුණ දීමේදී එකිනෙකාට සහයෝගය දක්වා ඇත. මේ සම්බන්ධයෙන්

දෙරට අතර සහයෝගීතාවය සමීප සහ මිත්‍රශීලී ද්විපාර්ශවික බැඳීම් සනිටුහන් කරන අතර එය දෙරට ජනතාවගේ සුබසිද්ධිය සහ ඔවුන් අතර සහෝදර සහ ශිෂ්ටාචාරමය බැඳීම් වර්ධනය කිරීමට තවදුරටත් ඉවහල් වනු ඇත.

***

කොළඹ
2021 අප්‍රේල් 29